කොවිඩ් 19 - සති පාසල

2021 - තුන්වන වාරය - දෙවන සතිය

10 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව

## 5 පාඩම - නිෂ්පාදන කර්මාන්ත

**මෝටර් රථ කර්මාන්තය (පෙළ පොත පිටු අංක 94-98)**

- ලෝකයේ ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින කර්මාන්තයක් ලෙස මෝටර් රථ කර්මාන්තය හැඳින්විය හැකිය.
- එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස වර්ධනය වීම මෝටර් රථ කර්මාන්තයේ දක්නට ඇති විශේෂත්වයකි.
- අතීතයේ මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තයට ප්‍රමුඛ වූයේ සංවර්ධිත රටවල් වන අතර වර්තමානයේ ආසියාතික රටවල් රැසක් මෝටර් රථ නිෂ්පාදනය කෙරෙහි යොමු වී ඇත.
- වර්තමානයේ මෝටර් රථ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා රොබෝට් යන්ත්‍ර, ස්වයංක්‍රීය යන්ත්‍ර වැනි යාන්ත්‍රික ශ්‍රමය බහුලව යොදා ගනී.

**ක්‍රියාකාරකම**

01. එකලස් කිරීමේ කර්මාන්තය යන්න පැහැදිලි කරන්න.

02. 2012 වනවිට ලොව මෝටර් රථ නිෂ්පාදනයේ ප්‍රමුඛයා කවුරුන්ද?

03. 1950 - 2000 කාලවකවානුව තුළ මෝටර් රථ නිෂ්පාදනයේ ප්‍රමුඛ රටක් වූවද, 2010න් පසු මුල් දස දෙනාගෙන් ගිලිහී ගිය රට කුමක්ද?

04. උපයෝගීතාව අනුව නවීන මෝටර් රථවල සිදුකර ඇති වෙනස්කම් විස්තර කරන්න.

05. වර්තමාන ලෝකයේ මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තයේ සීඝ්‍ර දියුණුවට හේතු තුනක් දක්වන්න.

06. මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තයේ දක්නට ඇති ලක්ෂණ හා ප්‍රවණතා තුන බැගින් දක්වන්න.

07. 1950 මුල් යුගයේදී හා 2012න් පසු මෝටර් රථ නිෂ්පාදනයේ ප්‍රමුඛතාව ලබාගත් ආසියාතික රටවල් වෙන වෙනම ලියන්න.

08. ඉහත රටවල් ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න.